# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 7 ශ්‍රේණිය



## 19 පාඩම

# දුං දුමටයි අඟුරු මටයි

1.0 නිපුණතාව

සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

1.4 නිපුණතා මට්ටම

සාවධාන ව සවන් දී තොරතුරු රැස් කරයි.

## ක්‍රියාකාරකම 01

- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ගුවන්විදුලියෙන් ප්‍රචාරය වන වැඩසටහන් පහක් නම් කරන්න.

 ..............................................................................................................

2. 'තුන්පත් රටා' වැඩසටහන් මාලාව විකාශය වූයේ කුමන ගුවන්විදුලි නාලිකාවක් ඔස්සේ ද?

 ..............................................................................................................

3. 'ගුවන්විදුලියට සවන් දෙන්නා' කුමන නමකින් හැඳින්වේ ද?

 ..............................................................................................................

4. යම්කිසි පණිවිඩයක් විශාල පිරිසක් අතරට ගෙන යෑම වර්තමානයේ හැඳින්වෙන්නේ කුමන නමකින් ද?

 ..............................................................................................................

5. 'අඬ බෙරේ' මුලින් 'අණ බෙරේ' යනුවෙන් හැඳින්වූයේ ඇයි?

 ..............................................................................................................

6. අද සමහර පළාත්වල තොරතුරු දැනුම් දීම සඳහා අඬ බෙරය යොදා ගැනේ. එසේ දැනුම් දෙන්නේ කුමන පණිවිඩ ද?

.................................................................................................................

7. පණිවිඩ යැවීම සඳහා රතු ඉන්දියානු ගෝත්‍රිකයන් අතර බෙහෙවින් ජනප්‍රිය සන්නිවේදන මාධ්‍යය කුමක් ද?

.................................................................................................................

8. දුටුගැමුණු රජ්ජුරුවන් කතරගම දේවාලයට ගම්බිම් දුන්නේ කෙසේ ද?

.................................................................................................................

9. ඌව පළාතේ සමහරුන් කියන ආකාරයට 'ඌව' යන නම ලැබුණේ කුමක් හේතු කොට ගෙන ද?

.................................................................................................................

10. සිරිපා පුදන්නට ගිය බැතිමතෙක් ඝණ්ටාරය පස්වරක් නාද කළොත් ඉන් කියවෙන්නේ කුමක් ද?

# ක්‍රියාකාරකම 02

- පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

1. තෝරා බේරා ගෙන අර්ථවත් ගුවන්විදුලි වැඩසටහන්වලට සවන් දීමෙන් ඔබට දැනුම හා රසඥතාව වර්ධනය කරගත හැකි යි. (    )
2. 'දුං දුමටයි අඟුරු මටයි' පාඩම උපුටා ගෙන ඇත්තේ ජේ.බී. දිසානායකයන්ගේ 'තුන්පත් රටා - 3; සිංහල සිරිත් විරිත්' නම් කෘතියෙනි. (    )
3. යමක් ඕනෑවට වඩා ප්‍රචාරය කරන විට "ඕකට ඔය තරම් අඬබෙර ගහන්න ඕනයැ"යි සිංහල ගැමියෝ කියති. (    )
4. දුම් ගොබයකින් කියැවෙන පණිවිඩය එයින් මතුවන දුම් වළලු ¨ ගණන අනුව වෙනස් වේ. (    )
5. එදා ගම්වල පැවතියේ නවීන සන්නිවේදන ක්‍රම වේ. (    )

6. ඈත වෙල්යාය ඉස්මත්තේ කිසිවකු යන විට ඔහුගේ අවධානය යොමු කර ගැනීමට ඇති හොඳ ම මාර්ගය මහ හඬින් හූ කීම යි.
( )

7. සමහර කැලෑබද පළාත්වල, හේන් කොටන කාලයට හූ හඬවල් නිතර ඇසේ. ( )

8. ගැමියන් සන්නිවේදනය සඳහා හූ හඬ යොදා ගත් අයුරු මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා හෙළි කර තිබේ. ( )

9. 'සද්ද පූජාවට' ඝණ්ටාර නාද කිරීම සිදු නො කෙරිණි. ( )

10. රජ්ජුරුවන් සඳහා කරන කාර්යයන් හැඳින්වෙන්නේ 'රාජකාරි' නමිනි.

( )

## ක්‍රියාකාරකම 03

- පහත වැකිවල හිස්තැන්හි විශේෂණ පද යොදා ලියන්න.

1. ..................... ශිෂ්‍යයා ..................... පොත කියවයි.
2. ..................... ගායිකාවක් ..................... ගීයක් ගැයුවා ය.
3. .................. ගව රැළක් ..................... කුඹුරකට පැන .................. පැළ කෑ හ.
4. ..................... සුළඟක් හමා ..................... ගස් ..................... වැටිණි.

## ක්‍රියාකාරකම 04

- පහත දැක්වෙන වාක්‍ය නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද යොදා නැවත ලියන්න.

1. ස්ත්‍රිය වල්පැළ නෙළයි.
2. සඳ නැගෙයි.
3. වස්සා දුවයි.
4. සුළඟ හමයි.
5. කුරුල්ලෝ කෑදලි සාදති.

# ක්‍රියාකාරකම 05

- පහත වාක්‍යවල ඇතුළත් ක්‍රියා විශේෂණ පද උපුටා දක්වන්න.

1. දරුවා බියෙන් අඬයි. - ....................................
2. සුළඟ වේගයෙන් හමයි. - ....................................
3. ඔහු පරෙස්සමෙන් රිය පදවයි. - ....................................
4. ළමයා සතුටින් සෙල්ලම් කරයි. - ....................................
5. ඇය හොඳින් ඉගෙන ගනියි. - ....................................

## ක්‍රියාකාරකම 01 - පිළිතුරු

1. ප්‍රවෘත්ති, සඟරා වැඩසටහන්, විචිත්‍රාංග, වාර්තා වැඩසටහන්, සංගීත වැඩසටහන්, විවිධ විෂය ක්ෂේත්‍ර හා සම්බන්ධ සාකච්ඡා, නාට්‍ය වැඩසටහන්

2. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය ඔස්සේ

3. ශ්‍රාවකයා

4. ජන සන්නිවේදනය

5. මේ බෙර හඬ වාදනය කර රජ්ජුරුවන්ගේ අණක් ප්‍රකාශ කළ බැවිනි.

6. ගම් සභාවේ රැස්වීමක් පවත්වන දිනය හෝ වැවේ වතුර මුදා හරින දිනය හෝ ගැමියන්ට දැනුම් දීමට

7. 'දුම් ගොබ' අහසට යැවීම

8. හූ හඬේ ආධාරයෙනි. කඳු මුදුනක සිට හූවක් කියා ඒ හූ හඬ යම්තාක් දුරකට ඇසේ ද ඒ තාක් දුර පිහිටි ඉඩකඩම් සියල්ල කතරගමට පැවරූ බව ජනප්‍රවාදයෙහි එයි.

9. 'හූව' හේතු කොට ගෙනයි.

10. පස්වරක් සිරිපා වඳින්නට පැමිණි බවයි.

# ක්‍රියාකාරකම 02 - පිළිතුරු

1. තෝරා බේරා ගෙන අර්ථවත් ගුවන්විදුලි වැඩසටහන්වලට සවන් දීමෙන් ඔබට දැනුම හා රසඥතාව වර්ධනය කරගත හැකි ය. ( ✓ )

2. 'දුං දුමටයි අඟුරු මටයි' පාඩම උපුටා ගෙන ඇත්තේ ජේ.බී. දිසානායකයන්ගේ 'තුන්පත් රටා - 3; සිංහල සිරිත් විරිත්' නම් කෘතියෙනි. ( ✓ )

3. යමක් ඕනෑවට වඩා ප්‍රචාරය කරන විට " ඕකට ඔය තරම් අඬබෙර ගහන්න ඕනයැ"යි සිංහල ගැමියෝ කියති. ( ✓ )

4. දුම් ගොබයකින් කියැවෙන පණිවිඩය එයින් මතුවන දුම් වළලු ගණන අනුව වෙනස් වේ. ( ✓ )

5. එදා ගම්වල පැවතියේ නවීන සන්නිවේදන ක්‍රම වේ. ( ✗ )

6. ඈත වෙල්යාය ඉස්මත්තේ කිසිවකු යන විට ඔහුගේ අවධානය යොමු කර ගැනීමට ඇති හොඳ ම මාර්ගය මහ හඬින් හූ කීම යි. ( ✓ )

7. සමහර කැලෑබද පළාත්වල, හේන් කොටන කාලයට හූ හඬවල් නිතර ඇසේ. ( ✓ )

8. ගැමියන් සන්නිවේදනය සඳහා හූ හඬ යොදා ගත් අයුරු මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා හෙළි කර තිබේ. ( ✓ )

9. 'සද්ද පූජාවට' ඝණ්ටාර නාද කිරීම සිදු නො කෙරිණි. ( ✗ )

10. රජ්ජුරුවන් සඳහා කරන කාර්යයන් හැඳින්වෙන්නේ 'රාජකාරී' නමිනි. ( ✓ )

## ක්‍රියාකාරකම 03 - පිළිතුරු

1. දක්ෂ ශිෂ්‍යයා පාඩම් පොත කියවයි.
2. ආධුනික ගායිකාවක් මිහිරි ගීයක් ගැයුවා ය.
3. මී ගව රැළක් සරුසාර කුඹුරකට පැන ගොයම් පැළ කෑ හ.
4. මහ සුළඟක් හමා පොල් ගස් ඉදිරී වැටිණි.

## ක්‍රියාකාරකම 04 - පිළිතුරු

1. වියපත් ස්ත්‍රිය වල්පැළ හෙමින් නෙළයි.
2. පසළොස්වක සඳ දීප්තිමත්ව නැගෙයි.
3. රතු වස්සා වේගයෙන් දුවයි.
4. සීත සුළඟ සෙමින් හමයි.
5. වඩු කුරුල්ලෝ කැදලි අලංකාරව සාදති.

## ක්‍රියාකාරකම 05 - පිළිතුරු

1. දරුවා බියෙන් අඬයි. - බියෙන්
2. සුළඟ වේගයෙන් හමයි. - වේගයෙන්
3. ඔහු පරෙස්සමෙන් රිය පදවයි. - පරෙස්සමෙන්
4. ළමයා සතුටින් සෙල්ලම් කරයි. - සතුටින්
5. ඇය හොඳින් ඉගෙන ගනියි. - හොඳින්


සැකසුම - මහේන්ද්‍ර මද්දේගම
චන්ද්‍රරතන විද්‍යාලය, කැලණිය